ඩෙංගු පැතිරීම වළක්වන්න ජන සහායත් අත්‍යවශ්‍යයි

ලංකාදීප
2009 අප්‍රේල් මස 29 වැනිදා බදාදා
අන්තර් ජාලයට එක්වූ ප්‍රථම සිංහල පුවත්පත
වෙබ් අඩවිය www.lankadeepa.lk
කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5330813 ෆැක්ස් : 2438039, බෙදාහැරීම් : 2435454, 2448322, 2479625 ෆැක්ස් : 2459725
දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2304144

ඩෙංගු උණ රෝගය ශීඝ්‍රයෙන් පැතිර යාමත් සමග මතු වී ඇති අනතුරුදායක තත්ත්වය සැලකිල්ලට ගනිමින් තංගල්ල නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ජාතික පාසල් දෙකක් සහ පළාත් සභා පාසල් හයක් ඉකුත් 28දා සිට එළැඹෙන 4 වැනිදා දක්වා වසා තැබීමට තීරණය කර ඇතැයි සඳහන් ප්‍රවෘත්තියක් අප පුවත්පත ඊයේ වාර්තා කළේය. සති කීපයක සිට තංගල්ල ප්‍රදේශයේ ඩෙංගු උණ රෝගය පැතිර යමින් පවතින බවත් මේ වනවිට රෝගීන් 42කු පිළිබඳ වාර්තා වී ඇති බවත් එම ප්‍රවෘත්තියේ සඳහන්ය. ඩෙංගු උණ රෝගයෙන් පෙළුණු ළමයින් දෙදෙනෙකු ඇතුළු පස් දෙනෙකු මියගොස් ඇතැයි වාර්තා වී තිබෙන තත්ත්වය තුළ දින කීපයක් පාසල් වසා දැමීමට තීරණය කිරීම " අවදානමට වඩා සූදානම වටී" යැයි එන කියමන සිහි ගන්වන්නකි.

ඩෙංගු උණ රෝග වාහක මදුරුවා දිවා කල සරන්නෙක් හෙයින් පාසල් වසා දැමීමේ තීරණය හැර වෙනත් තීරණයකට ආසන්න වශයෙන් එළැඹිය නොහැකි බව සත්‍යයකි. එහෙත් ප්‍රශ්නය වන්නේ එම තීරණය ඩෙංගු උණ ප්‍රහාරයට කවරාකාරයේ පිළිතුරක් වන්නේද යන්නය. එළැඹ ඇති හදිසි අනතුරුදායක තත්ත්වය හමුවේ එබඳු කඩිනම් පියවරකට අවතීර්ණ වුවද ඩෙංගු උණ ප්‍රහාරයට එය සවිමත් හෝ ප්‍රමාණවත් පිළිතුරක් නොවන බව ඉඳුරාම සත්‍යයකි.

රත්නපුර දිස්ත්‍රික්කයේ චිකුන් ගුන්යා උණ රෝගය වසංගතයක් මෙන් පැතිර ගියේය. ඒ මෙයට හාර පස් මාසයකට එපිටදීය. එහි තත්ත්වය කොතෙක් බරපතළ වූයේද යත් රුවන්පුරය හැඳින්වූයේ විශාලා මහනුවර ලෙසය. කාලයත් සමග උණද බැස ගියේය. දැන් රත්නපුරය සුපුරුදු නිස්කාංසුවේ ගිලී සිටී. යළිත් එබඳු උවදුරක් මතුවීම වැළැක්වීම සඳහා කවර තරමේ ප්‍රමාණවත් පියවර ගෙන ඇද්දැයි වාර්තා වී නැත. යළිත් එම අවධානය යොමු වන්නේ චිකුන් ගුන්යා හිස ඔසොවා ප්‍රදේශය ආක්‍රමණය කිරීමට පටන් ගත් කල්හි නම් එතැන තිබෙන්නේ බේදවාචකයකි.

තංගල්ල ඩෙංගු උණ රෝගය පැතිර යාම සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු වන්නේ ඉහත තත්ත්වයද සැලකිල්ලට ගනිමිනි.

ඩෙංගු උණ රෝගය පැතිරයාම වැනි අනතුරුදායක තත්ත්වයන් සම්බන්ධයෙන් විමතියට පත් විය යුතු නැත. එය එම උණ රෝගයේ ස්වභාවයම විනා අන් යමක් නොවේ. මිනිස් සමාජය සමත් විය යුත්තේ එබඳු ව්‍යාධීන්ට මුහුණ දීමේ හැකියාව නිර්මාණය කර ගැනීමටය. එමෙන්ම එම රෝගී තත්ත්වයන් නිර්මණය වීම වැළැක්වීමටය.

මෙක්සිකෝවද අද උණෙන් සලිත වෙමින් තිබේ. එම රෝග වසංගතය ආසියාවටද පැතිරයාමේ අවදානමක් තිබෙන බවට අනතුරු ඇඟවීම් කර තිබේ. මෙබඳු අනතුරු ඇඟවීම් ඉදිරිපිට සමාජයක් පසු බැස යා යුතුද? නොඑසේනම් මෙම අනතුරුදායක තත්ත්වයට මුහුණ දීමේ ශක්තිය නිර්මාණය කර ගත යුතුද? රෝග වාහකයා පැමිණි පසු කලබලවී මහා සංග්‍රාමයක් ආරම්භ කිරීම වෙනුවට කල් ඇතිව එයට මුහුණදීමේ ශක්තිය නිපදවා ගැනීමට සමාජයක් සමත්විය යුතුය.

තංගල්ලේ පාසල් ගණනාවක දරුවන්ගේ අධ්‍යාපනයට කණකොකා හැඬවූ ඩෙංගු මදුරුවා තංගල්ලට ආවේණික විශේෂිත රෝග වාහකයෙක් නොවේ. එහෙත් ඉක්ම යන මොහොත තුළ තංගල්ල තම අණසකට ගැනීමට ඩෙංගු මදුරුවා සමත්ව සිටී. ඒ ඩෙංගු මදුරුවා ඕපපාතික නැත. ඩෙංගු මදුරුවා බෝ වන්නේ කෙසේ දැයි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති විවිධ වෛවර්ණ පත්‍රිකාවලද ඉහළින්ම සටහන් කර තිබේ. එම පත්‍රිකා කියවීම නිලධාරීන්ගේ වගකීමය. ඔවුන් ඒවා කියවා කළමනා කටයුතු කරන්නේ දැයි විමසා බැලීම බලධාරීන්ගේ වගකීමය. මෙම වගකීම් දෙකම නිසිලෙස එකවර ක්‍රියාත්මක වූයේ නම් තංගල්ල අද ඩෙංගු උණෙන් සලිත වන්නේ නැත.

ඩෙංගු උණ රෝග වසංගතය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුත්තෝ තංගල්ල නගර වැසියෝ පමණක් නොවෙති. රටේ මුළු මහත් ජනතාවම ඒ සම්බන්ධයෙන් හදිසි අවධානයක් යොමුකළ යුතු අනතුරුදායක තත්ත්වයක් එළැඹ තිබේ. ඩෙංගු මදුරුවා බෝවීම වැළැක්වීම සඳහා මහා මිනිස් සංග්‍රාමයක් ආරම්භ කළ යුතුය. සාමූහික විචාර බුද්ධියෙන් යුතු සමාජයකට එය අසීරු නොවන්නකි.

එහෙත් එළැඹ තිබෙන්නේ සාමූහික විචාර බුද්ධියෙන් යුතුවම කටයුතු කරන සමාජයක් නොවේ. තමන්ගේ කුණු තමන්ගේ නොවන වෙනත් ඕනෑම තැනක දමා අත පිසදා ගැනීම උණක් මෙන් පැතිර යන සමාජයක් ඩෙංගු මදුරුවාට තෝතැන්නකි. තංගල්ලේ ඩෙංගු උණට පිළියම් යෙදිය යුතු වන්නාසේම එම ඩෙංගු උණ වසංගතය තංගල්ලේම වළ දැමීම සම්බන්ධයෙන්ද සෙසු පළාත්හි ජනයා පෙරමුණ ගත යුතුය.

කාලීන සටහන

රජය දුරදිග සිතිය යුතුය

සිංගප්පූරුවේ නැංයෑං තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයන අංශයේ මහාචාර්ය රොහාන් ගුණරත්න දේශපාලන ප්‍රචණ්ඩත්වය හා ත්‍රස්තවාදී පර්යේෂණ පිළිබඳ අන්තර් ජාතික කේන්ද්‍රයේ ප්‍රධානියාය. ත්‍රස්තවාදයට එරෙහි ත්‍රමෝපාය පිළිබඳ ඊශ්වරලය අන්තර් ජාතික ප්‍රතිපත්ති ආයතනයේ ගරු සාමාජිකයකු වන මහාචාර්ය රොහාන් අල්කයිඩා ත්‍රස්තවාදී ජාලය පිළිබඳ ජගත් විශාරදයෙකි. ඔහු ඇමෙරිකාවේ වෙස්ට් පොයින්ට්හි යුද හමුදා ඇකඩමියේ ත්‍රස්තවාදී සටන් අධ්‍යයන මධ්‍යස්ථානයේ හිටපු ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි. අන්තර් ජාතික සාමය පිළිබඳව ඇමරිකාවේ නොට්රේ ඩේවී සරසවියෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති රොහාන් ගුණරත්න ශාන්ත ඇන්ඩෘ සරසවියෙන් අන්තර් ජාතික සබඳතා පිළිබඳ ආචාර්ය උපාධිය ලබාගෙන ඇත. ඔහු ත්‍රස්තවාදය සම්බන්ධයෙන් පොත් ගණනාවක් ලියා තිබේ. මේ ඔහු ලංකාදීපය සමග කළ විශේෂ සම්මුඛ සාකච්ඡාවකි.

ලංකාව ලෝකයේ තිබෙන කුඩා රටකි. ඒ වගේම දූෂිත රටකි. හොරුන්ට අවස්ථාව ලබා නොදී රට ගොඩනැගීම අත්‍යාවශ්‍ය සාධකයකි. යුද්ධය දේශපාලනික වශයෙන් නොගත යුතු කරුණකි. විදේශ ප්‍රතිපත්තිය හා ජාතික ආරක්ෂාව ද්විපාර්ශ්වික විය යුතුය. රටක් පැවතෙන්නේ ඒ මතය. ඒනිසා අප ඒවා සමඟ සෙල්ලම් නොකළ යුතුය. යුද්ධය දේශපාලනික වශයෙන් පාවිච්චි කිරීම වැරැදිය.



මහාචාර්ය
රොහාන් ගුණරත්න

ලංකා රජය සහ ජනතාව මින් ඉදිරියට සිතිය යුත්තේ ප්‍රභාකරන් සහ එල්.ටී.ටී.ඊ.ය ගැන නොවේ. ප්‍රභාකරන් සහ එල්ටීටීඊය තව මාස කීපයකින් සම්පූර්ණයෙන් පරාජය කිරීමේ හැකියාව හමුදාව සහ දේශපාලන නායකයන්ට ලැබී තිබේ. එනිසා මේ අවස්ථාවේ සිට ලංකා රජය සිතිය යුත්තේ, ඉලක්ක කළ යුත්තේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර පාලමක් ගොඩ නගන ආකාරය ගැනය. මිත්‍රත්වයක් ඇති කරන ආකාරය ගැනය. වසර තිහක පමණ කාලයක් තිස්සේ උතුරු නැගෙනහිර ජනතාව දැක තිබෙන්නේ යුද්ධය පමණි. 1983 මේ ප්‍රදේශයක ඉපදුණු අයකු දැක තිබෙන්නේ යුද්ධය පමණි. ප්‍රභාකරන් වීරයෙක් වශයෙන් නොසැලකීමට, එල්.ටී.ටී.ඊ. සංවිධානය ගැන අකමැත්තක් ඇති කර ගැනීමට නම් මේ අය දකුණට පැමිණ රට දැක බලා ගෙන සිංහල, මුස්ලිම් අයත් මිනිස්සු බව ඒ අය වටහා ගත යුතුය.

එහෙත් මේ වන විට එල්.ටී.ටී.ඊ.ය ගෙන ගොස් ඇති ප්‍රචාර නිසා උතුරු නැගෙනහිර දෙමළ ජනතාව බොහෝ විට සිතන්නේ සිංහල මිනිසුන් දරුණු, ක්‍රෑර කණ්ඩායමක් වශයෙනි. මේ නිසා උතුරු නැගෙනහිර දියුණු කර රැකියා අවස්ථා බිහිකර කර්මාන්ත ඇති කර යටිතල පහසුකම් දියුණු කර දකුණේ තරම්ම ශක්තිමත් ආර්ථිකයක් ඇති කිරීමේ වැඩපිළිවෙළක්, උපක්‍රම රජය ඇති කර ගත යුතුය. එපමණක් නොව කොළඹ සිට යාපනය දක්වා සුපිරි අධිවේගී මාර්ගයක් ඉදි කළ යුතුය. ගමනාගමනය වැඩි වී ආර්ථිකය දියුණු වී තිබෙන්නේ එවැනි මාර්ග පද්ධතියක් ඇති රටවලය. ආර්ථිකය දියුණුවීමට ජනතාව එක් එක් පළාත්වලට ගමන් කළ යුතුය. ඔවුන්ගේ අදහස් වෙනස් වන්නේ එවිටය.

උතුරේ සහ නැගෙනහිර සිටින සෑම පුද්ගලයකුටම දකුණට පැමිණීමේ අවස්ථාවක් ඇති කළ යුතුය. ප්‍රභාකරන් දෙමළ ජනතාවගේ සියලුම අයිතිවාසිකම් උදුරාගෙන ඔවුන් ඉතා දුක්ඛ තැනකට ගෙන ගොස් තිබේ. අන්තිම මොහොතේ ප්‍රභාකරන් බලන්නේ තමන්ගේ ජීවත්වීම සහ තම ත්‍රස්තවාදී සංවිධානය පවත්වාගෙන යාමට සිවිල් ජනතාව යොදා ගැනීමටය. සිවිල් ජනතාව බලෙන් රඳවා තබා ගෙන සිටින්නේ ඒ සඳහාය. ප්‍රභාකරන් යනු දෙමළ ජනතාවට සෙතක් සැලසූ නායකයකු නොවේ. පළමු දිනයේ සිටම දුක උරුම කර දුන් නායකයෙකි.

දෙමළ ජනතාවට දුක උරුම කරදුන්නේ ප්‍රභාකරන්

1970 ගණන්වල තංගවේළු සහ කුට්ටිමනී යනුවෙන් ද්‍රවිඩ ත්‍රස්තවාදී නායකයන් දෙදෙනකු සිටි බව මතක් කර දිය යුතුය. මේ දෙදෙනා අත්අඩංගුවට ගත් පසු එක් අයකු කියා තිබුණේ ද්‍රවිඩ ව්‍යාපාරය ප්‍රභාකරන් අතට ගත්තා නම් ද්‍රවිඩ ජනතාව සම්පූර්ණයෙන්ම විනාශ කරන බවය. එදා ඔහු කී කතාව සත්‍යයකි. අද වන විට දෙමළ ජනතාව කොතරම් දුකට පත් වී තිබෙනවා ද? මේ යුද්ධයෙන් වැඩියෙන්ම දුකට පත් වී සිටින්නේ දෙමළ ජනතාවය. එනිසා අප සිතිය යුත්තේ සිංහල, දෙමළ, මුස්ලිම් ආදී වශයෙන් නොවේ. ලාංකිකයන් වශයෙනි. ක්‍රියාකළ යුත්තේද ලාංකිකයන් වහයෙන් සිතා ක්‍රියා කළේ නැතිනම් කිසි දිනක එක්සත් ලංකාවක් ගොඩනැගීමට හැකි වන්නේ නැත. වෙන් වෙන් වශයෙන් සිතුවහොත් සිංහල, දෙමළ, මුස්ලිම් ආදී වශයෙන් රාජ්‍ය බිහිවන්නට පුළුවන. ඒ නිසා සමාජීය වෙනස්කමක් ඇති කිරීමට අපේ දේශපාලකයන්ට හැකි විය යුතුය.

ලාංකික අනන්‍යතාව ඇති කිරීමට හැකි තරම් ක්‍රියා කළ යුතුය. එසේ කර රට දියුණු කළ යුතුය. රජයේ ඉලක්කය වී තිබුණේ හමුදා ක්‍රියාමාර්ග හරහා ත්‍රස්වාදය පරාජය කිරීමය. ආරක්ෂක අංශ දක්ෂ ලෙස ක්‍රියාකර එම කටයුත්ත තවත් කෙටි කාලයකින් අවසන් කරනු ඇත. එනිසා මේ ජනතාව සමඟ ආර්ථික, සමාජ, දේශපාලන වශයෙන් මිත්‍රත්ව පාලමක් ගොඩනගන ආකාරය ගැන ජනාධිපතිවරයා සිතිය යුතුය. මේ කටයුත්ත කිරීමට යුද්ධය අවසන් වන තුරු බලා සිටීමට අවශ්‍ය නැත. අද පටන් එම කටයුත්ත ආරම්භ කළ යුතුය. ලංකාව දියුණු රටක් බවට පත් කළ හැක්කේ එසේ වුවොත් පමණි.

යුද්ධය ජයගත් දේශපාලන නායකයන් බොහෝ දුරට පරාජය වනු ඇත. එයට හේතුව ඔවුන් යුද්ධය ගැන වැඩි වශයෙන් සිතීමය. ආර්ථිකය ගැන එතරම් සිතන්නේ නැත. ජනාධිපති රාජපක්ෂ එම උගුලට හසු නොවිය යුතුය. ශක්තිමත් සැලසුමක් අනුව කටයුතු කළ යුතුය.

එල්.ටී.ටී.ඊ.යට මේ ඉරණම අත්වූයේ කරුණු හතරක් නිසාය. ඉන්දීය සාමසාධක හමුදාව පැමිණි පසු ප්‍රභාකරන් හමුවීමට අවස්ථාවක් මට ලැබුණි. එම හමුවීම සිදු වූයේ ජයවර්ධන ජනාධිපතිවරයාගේ ඉල්ලීම අනුවය. ප්‍රභාකරන් ඉන්දීය හමුදාවත් සමඟ සටන් කරනවාද නැති නම් සාමක්‍රියාදාමය පිළිගෙන යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වනවාද යන්න ගැන දැන ගැනීමට ජයවර්ධන ජනාධිපතිවරයාට අවශ්‍ය වී තිබුණි. ප්‍රභාකරන් සමග කතා කළ විට ඔහු අවංකභාවයක් පෙන්නුම් කළේ නැත. ඔහුට තිබුණේ පටු දර්ශනයකි. ඔහු ලබා තිබුණේත් අඩු අධ්‍යාපනයක් වුවත් යුද්ධයේ දක්ෂයෙකි. දේශපාලනික වශයෙන් ඔහුට තිබුණේ අඩු තේරුමකි. ඔහු වරෙක අවි භාර දුන්නද හොඳ අවි භාර දුන්නේ නැත. පසුව ඒවා භාවිත කර යුද්ධය ආරම්භ කෙරුණි. පළමු වැරැද්ද එයයි.

එල්.ටී.ටී.ඊ.යේ කණ්ඩායම් දහයක් පුහුණු කළේ ඉන්දියාවේය. මේ නිසා ප්‍රේමදාස ජනාධිපතිවරයා සිටියේ කෝපයෙනි. මුල් කාලයේ ඉන්දියාව එල්.ටී.ටී.ඊ යට උදව් කළද පසු කාලයේ උදව් නොකළ බව ප්‍රේමදාස මහතා වටහාගෙන සිටියේ නැත. ප්‍රේමදාස ජනාධිපතිවරයා එල්.ටී.ටී.ඊ. ය සමඟ සාකච්ඡා කළේ අවංකවය. එහෙත් ප්‍රභාකරන් අතට අත දුන්නේ මේ රටෙන් ඉන්දියන් හමුදාව යවා ගැනීමටය. සාමය ඇති කර ගැනීමට තිබූ අවස්ථාව ප්‍රභාකරන් නැති කර ගත් දෙවැනි අවස්ථාව එයයි.

එල්.ටී.ටී.ඊ. ය රජය සමඟ සාකච්ඡා කරන්නේ ඒ කාලය තුළ අවි ආයුද රැස් කිරීමට බවත් එසේ කළ පසු යුද්ධයට යන බවත් එනිසා ප්‍රභාකරන් විශ්වාස නොකළ යුතු බවත් චන්ද්‍රිකා ජනාධිපතිනියට කියූ විට ඇය එය පිළිගත්තේ නැත. ඇය මේ සම්බන්ධව උපදෙස් ගත්තේ නැත. මේ කාලයේ එල්.ටී.ටී.ඊ.ය යුක්තේන් රටෙන් පුපුරන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබුණි. ඔවුන් පළමු ගුවන් යානය ගෙනාවේ ද යුක්තේනයෙනි. සාම ගිවිසුමක් ඇති කර ගත්ත ද එයද කඩ කළ බව පැහැදිලිය. ත්‍රිකුණාමලයේ නැව් දෙකකට පහරදී යුද්ධය නැවත ආරම්භ කෙරුණි. තුන්වැනි කරුණ එයයි.

ලංකාවේ විනාශයට හේතුව ජාතිවාදයයි

හතර වැනි කරුණ වන්නේ රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය දීම වැළැක්වීමය. රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රශ්නය විසඳීමට භාවිත කළේ වෙනස් උපක්‍රමයකි. එහෙත් රාජපක්ෂ රජය තෝරාගෙන තිබෙන්නේ යුද උපක්‍රමයයි. මේ නිසා ප්‍රභාකරන් කල්පනා කළේ රාජපක්ෂ මහතා බලයට පැමිණ යුද්ධයට ගියහොත් ජාත්‍යන්තර වශයෙන් සහාය ගෙන දෙමළ රාජ්‍යයක් ගොඩනැගීමටය. එහෙත් සැප්තැම්බර් ප්‍රහාරයෙන් පසුව ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් කිසිදු ත්‍රස්තවාදී සංවිධානයකට සහාය දක්වන්නේ නැත. ප්‍රභාකරන්ට මේවා වැටහුනේ නැත. එල්.ටී.ටී.ඊ යට සහාය දක්වන දෙමළ ජනයා ප්‍රභාකරන්ට දුන්නේ වැරැදි උපදෙස්ය. ඔවුන් කීවේ බටහිර රටවල් සහ ජාත්‍යන්තර ප්‍රජාව එල්.ටී.ටී.ඊ.ය සමඟ සිටින බවය. එහෙත් එය එසේ වූයේ නැත. මේ අනුව බලන විට ප්‍රභාකරන් නොසිතූ කටයුතු බොහොමයක් සිදු වුණි.

ප්‍රභාකරන් අවංක නොවන බවත් රැවටිලිකාරයකු බවත් වත්මන් රජය වටහාගෙන තිබේ. වසර තිහකට පසුව එල්.ටී.ටී.ඊ.ය යුදමය වශයෙන් දුර්වල වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එල්.ටී.ටී.ඊ. ය පවතින්නේ ප්‍රභාකරන් ගේ නායකත්වය නිසාය. ප්‍රභාකරන් ඝාතනය කිරීමට ආරක්ෂක අංශ කටයුතු කරමින් සිටින්නේ ඒ නිසාය. කෙසේ වුවත් මෙතැනින් එහාට යුද්ධයෙන් ගැලවීමට නම් රට දියුණු කළ යුතුය. රට දියුණු නොකර යුද්ධය පමණක් ඉලක්ක කළහොත් ත්‍රස්තවාදය දිගටම පවතින්නට පුළුවන. ජීවිතයේ ලොකුම දෙය යුද්ධය කර මැරීම නොවන බව එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට අවබෝධකර දිය යුතුය. ජීවිතය කුමක්ද යන්න පෙන්වාදිය යුතුය. රජයට තිබෙන විශාලම අභියෝගය එයයි. යුද්ධයේ අභියෝගය නොවේ. මේ රජයේ තිබෙන දුර්වලතාව වන්නේ ආර්ථික වශයෙන් දියුණු කිරීමට දැක්මක් නොමැතිවීමය. එම දර්ශනය ඇති විය යුත්තේ ජනාධිපතිවරයාටය.

අද පවතින තත්ත්වය යටතේ ප්‍රභාකරන් අත්අඩංගුවට ගැනීමට හෝ ඝාතනය කිරීමට අවස්ථාවක් තිබේදැයි යම් කෙනෙකු ප්‍රශ්න කරන්නට පුළුවන. ප්‍රභාකරන්ට මාර්ග දෙකක් තිබේ. ලංකාවෙන් පැනයාම ඉන් එකකි. ඔහු එසේ කළහොත් එල්.ටී.ටී.ඊ.ය මේ දක්වා කර ඇති පරිත්‍යාග සියල්ල අහිමිවනු ඇත. එහෙත් ප්‍රභාකරන් යුද්ධ කර මියගියහොත් එල්.ටී.ටී.ඊ. යේ දර්ශනය පවතිනු ඇත. ප්‍රභාකරන්ගේ නියම නායකත්වය පෙන්නුම් කරන්නේ ඔහු යුද පිටියේ මිය ගියොත්ය. සුභාෂ් චන්ද්‍රබෝස්, දුටුගැමුණු-එළාර, රොබින්හුඩ්, සරදියෙල් බොහෝ දෙනකුට මතකය. ඒ මේ අය බිය නොවී කටයුතු කළ නිසාය. ඒ නිසා ප්‍රභාකරන් පැන ගියහොත් ඔහු හඳුන්වන්නේ බියගුල්ලකු වශයෙනි. තමන්ගේ ජනතාව දමාගිය අයකු වශයෙනි. මා දන්නා තරමට ප්‍රභාකරන් පැන යන්නේ නැත.

ප්‍රභාකරන් යුද්ධ කර මිය ගියහොත් මේ රජය ඔහුගේ දර්ශනය මැරීමට කටයුතු කළ යුතුය. උතුරු නැගෙනහිර සෑම දෙමළ පුද්ගලයකුටම රැකියාවක්, නිවසක්, අධ්‍යාපනය සහ ආරක්ෂාව ලබාදිය යුතුය. එසේ කළොත් ප්‍රභාකරන්ගේ දර්ශනය මරා දැමීමට පුළුවන. මේ අවස්ථාවේ පටන් උතුරු නැගෙනහිර වැඩ පටන් ගත යුතුය. මේ අවස්ථාවේ පටන් ජනාධිපතිවරයා පාත්තරයක් රැගෙන විදේශ රටවලට ගොස් උතුරු නැගෙනහිර දියුණු කිරීමට මුදල් ඉල්ලා සිටිය යුතුය. නව කර්මාන්ත මේ ප්‍රදේශයේ අරඹා රැකියා උත්පාදනය කළ යුතුය.

ප්‍රභාකරන් මියගියහොත් වෙනත් නායකත්වයක් යටතේ එල්.ටී.ටී.ඊ. ය හිස ඔසවාවිදැයි තවත් ප්‍රශ්නයකි. ප්‍රභාකරන් නැති වුවොත් එල්.ටී.ටී.ඊ. නායකත්වය හිමි වන්නේ පොට්ටු අම්මාටන්ය. ප්‍රභාකරන් රටෙන් පැන ගියොත් නායකයා වන්නේ ද පොට්ටු අම්මාන්ය. එහෙත් ප්‍රභාකරන් යුද පිටියේ නැතිව ඔහුගේ පුත් චාල්ස් ඇන්තනි රටෙන් පැන ගියත් නියම නායකයා වශනේ සලකන්නේ ඔහුය. මේ යුද්ධයෙන් ජනප්‍රිය ව්‍යාපාරයක් ඇති වී තිබේ. මේ සඳහා ආධාර ලැබෙන්නේ පිටරටෙනි. එනිසා එය අඩපන කළ යුතුය. රජයේ ප්‍රචාරක ව්‍යාපාරය දුර්වලය. මේ නිසා දෙමළ අය සිතන්නේ සිංහලයන් ක්‍රෑර පිරිසක් වශයෙනි. එහෙත් මේ ජාති දෙකම ඉතිහාසයේ පටන් එකට ජීවත් වී තිබේ. මේ තත්ත්වය වටහා දිය යුතුය. ප්‍රභාකරන් උත්සාහ කර තිබෙන්නේ ජනතාව බෙදීමටය. එහෙත් රාජපක්ෂ ජනාධිපතිවරයා ජාති වශයෙන් නොසිතා ලාංකික ජාතිය ගැන පමණක් සිතා කටයුතු කළ යුතුය.

සිංහල ජාතිවාදය දෙමළ ජාතිවාදයට වඩා භායනකය. සිංහල ජාතිවාදය සිහිනයකි. එහි ශක්තිමත් පදනමක් නැත. මේ ජාතිවාදය ඇති කළ අය දවල් හීන දකින්නෝය. ඔවුහු භයානකය. එනිසා මේ ජාතිවාදය තුරන් කළ යුතුය. මේ ජාතිවාදය ඇති කරන්නන් සහ එල්.ටී.ටී.ඊ. ය අතර කිසිදු වෙනසක් නැත. එනිසා මේ සියලු දෙනා අත්අඩංගුවට ගත යුතුය. ලංකාවේ විනාශයට හේතු වී තිබෙන්නේ ජාතිවාදය බව මේ අය වටහා ගත යුතුය. ඒ වගේම මේ යුද්ධය කරන්නේ ත්‍රස්තවාදයට විරුද්ධව මිස දෙමළ ජනතාවට විරුද්ධව නොවන බවද වටහා ගත යුතුය. රජයේ සිටින ජාතිවාදී පුද්ගලයන්ගේද ඇස් ඇරවිය යුතුය.

ලංකාව ලෝකයේ තිබෙන කුඩා රටකි. ඒ වගේම දූෂිත රටකි. හොරුන්ට අවස්ථාව ලබා නොදී රට ගොඩනැගීම අත්‍යාවශ්‍ය සාධකයකි. යුද්ධය දේශපාලනික වශයෙන් නොගත යුතු කරුණකි. විදේශ ප්‍රතිපත්තිය හා ජාතික ආරක්ෂාව ද්විපාර්ශ්වික විය යුතුය. රටක් පැවතෙන්නේ ඒ මතය. ඒනිසා අප ඒවා සමඟ සෙල්ලම් නොකළ යුතුය. යුද්ධය දේශපාලනික වශයෙන් පාවිච්චි කිරීම වැරැදිය.

රටක ස්ථාවරත්වයක් ඇති කළ හැක්කේ යුදමය වශයෙන් නොවේ. ආර්ථික හා සමාජමය වශයෙනි. ඒනිසා මේ රජය දුරදිග සිතිය යුතුය. එසේ නොවුනහොත් යුද්ධයෙන් ලබාගෙන ඇති ප්‍රතිඵල සියල්ල අහිමි වන්නට පුළුවන.

ප්‍රභාකරන් මේ තත්ත්වයට පත් වී තිබෙන්නේ වැරැදි කළ නිසාය. දේශපාලන, යුද්ධමය, ජාත්‍යන්තර වශයෙන් ඔහු වැරැදි කර තිබේ. ඔහුට දැන් අවශ්‍ය වී තිබෙන්නේ නායකයකු වශයෙන් මිය යාමය.

1987 ට පෙර පැවැතියේ ගරිල්ලා යුද්ධයකි. ඒ ආකාරයෙන් තවත් වසර දෙකක්වත් එල්.ටී.ටී.ඊ.ය ගරිල්ලා යුද්ධය කර ගෙන යනු ඇත. එහෙත් රජය මේ ශක්තිය පාවිච්චි කළහොත් තවත් වසර දෙකකින් එල්.ටී.ටී.ඊ.ය සම්පූර්ණයෙන් නැති කිරීමට පුළුවන.

ඔත්තු සේවා මෙහෙයවා එල්.ටී.ටී.ඊ. නායකයන් හා ඔවුන්ට ආධාර දෙන අය ඝාතනය හෝ අත්අඩංගුවට ගැනීම කළ යුතුය. එසේ කර ස්ථාවරත්වය ඇති කළ යුතුය. රජයේ පළමු ප්‍රතිපත්තිය විය යුත්තේ උතුරු නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම නොවේ. ස්ථාවරත්වය ඇති කර ආර්ථික දියුණුව ඇති කිරීමය. දෙමළ, මුස්ලිම් ජනතාවට සහෝදරත්වයෙන් සැලකිය යුතුය.

එල්.ටී.ටී.ඊ.යට විරුද්ධව සටන් කිරීමේ දී ඔවුන්ගේ යුද බලය මෙන්ම ජාත්‍යන්තර සබඳතා කටයුතු නැති කිරීමද අවශ්‍යය. එහි දී අපේ විදේශ අමාත්‍යාංශය අනුගමනය කරන්නේ දුර්වල වැඩ පිළිවෙළකි. විදේශයක සිටින එල්.ටී.ටී.ඊ. ප්‍රධානියකු වන්නේ කුමරන් පද්මනාදන්ය. වෙනත් ආකාරයකට කියනවා නම් තර්මලිංගම් ෂන්මුගන් කුමරන්ය. ඔහු සිටින්නේ තායිලන්තයේය. කෙසේ හෝ ඔහු අත්අඩංගුවට ගත යුතුය. ඔහු ජීවතුන් අතර සිටියහොත් යළි එල්.ටී.ටී.ඊ. ය ගොඩනගනු ඇත. ඔහු ඒ තරම්ම දක්ෂයෙකි. ඒ වගේම ඔහු දරුණු අයෙකි. ඒනිසා මොහු අත් අඩංගුවට නොගතහොත් මේ යුද්ධය දිගටම පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත.

එල්.ටී.ටී.ඊ. යේ යුද නායකයන් සෑහෙන පිරිසක් මිය ගොස් තිබේ. එහෙත් ඔත්තු සේවාවේ නායකයන් වැඩි පිරිසක් ජීවතුන් අතරය. ඒ අය යුද නායකයන්ට වඩා භායනකය. ඒනිසා ඔවුන් විනාශ කිරීම හෝ අත්අඩංගුවට ගැනීම අවශ්‍යය. එල්.ටී.ටී.ඊ. යේ සිට යටත්වන අයට රැකියා, නිවාස, ආරක්ෂාව ලබා දෙන බවට රජය සහතික විය යුතුය. ඒ අය බලා ගැනීමට රජයේ වෙනම අංශයක් තිබිය යුතුය.



සටහන - චමින්ද මුණසිංහ

ඡායාරූපය - ශාන්ත රත්නායක

වෙසක් මස පෝය ලබන ගෙවෙන වේලාවන්

දිනය	පෝය	පෝය ලබන වේලාව	පෝය ගෙවෙන වේලාව
මැයි:01	පුර අටවක	ප.ව.03.12	02දා ප.ව.01.20
මැයි:08	පසළොස්වක	පෙ.ව.08.55	09දා පෙ.ව.09.31
මැයි:16	අව අටවක	ප.ව.11.57	18දා පෙ.ව.01.45
මැයි:.23	අමාවක	ප.ව.08.42	24දා ප.ව.05.40